# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.12.02 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2160/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් 06 දෙනෙකු අතඅඩංගුවට - යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.11.30 වන දින කෝපායි පොලිස් ස්ථානයට වාර්තා වූ පිහිවලින් කපා කොටා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව, 2025.12.01 වන දින මෙම අපරාධය සිදු කළ සැකකරු හා ඊට ආධාර අනුබල දුන් සැකකරුවන් 05 දෙනෙකු, අපරාධය සිදු කිරීමට යොදා ගත් වෑන් රථයක්, යතුරුපැදියක් හා ජංගම දුරකථන 03 ක් සමඟ යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය විසින් අත්අඩංගුවට ගෙන කෝපායි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 23 ත් 32 ත් අතර වයස්වල පසුවන යාපනය, කන්කසන්තුරය, කියිට්ස් හා තෙලිප්පලේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කෝපායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. සැකකටයුතු මරණයක් - අරලගංවිල පොලිස් වසම.**

අරලගංවිල පොලිස් වසමේ වෙහෙරගල ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු මියගොස් සිටින බවට 2025.12.01 වන දින අරලගංවිල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ වෙහෙරගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු පදිංචි නිවසේ නිදන කාමරය තුල මියගොස් සිට ඇති අතර ඔහු මෙම නිවසේ තනිව පදිංචිව සිට ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෙම මරණය සිදු වූ ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැති අතර අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - තලාතුඔය පොලිස් වසම.

2025.12.01 වන දින උදෑසන කාලයේ තලාතුඔය පොලිස් වසමේ මයිලපිටිය ප්‍රදේශයේ වික්ටෝරියා ජලාශයේ කාන්තා මළ සිරුරක් ඇති බවට තලාතුඔය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරියගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තලාතුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - මුලතිව් පොලිස් වසම.

2025.11.30 වන දින මුලතිව් පොලිස් වසමේ පුදුමාතලන් වෙරළ තීරයට මෘත ශරීරයක් ගොඩගසා ඇති බවට මුලතිව් පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය මාන්චෝලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මුලතිව් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදන්වීමක් - පොළොන්නරුව පොලිස් වසම.

2025.12.01 වන දින රාත්‍රී කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ බුද්ධිමණ්ඩපය ඉදිරිපිට ඇති 01 ඇලෙහි දිය නෑමට ගිය පුද්ගලයෙකු සැඩ පහරට හසු වී අතුරුදන් වී ඇති බවට පොළොන්නරුව පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් මත නිලධාරීන් කණ්ඩායමක් විසින් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ මඩොල්සිම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම ලොරි රථයකින් මෙම ස්ථානයට පැමිණ ඇති අතර තම රිය සහයකයා සමඟ දිය නාමින් සිටියදී මෙසේ අතුරුදන් වී ඇත. මෙම ඇලෙහි ජල පහර අධික වේගයකින් ගලා යන බැවින් මේ දක්වා අතුරුදන් වූ පුද්ගලයා සොයා ගැනීමට නොහැකි වී ඇත. පොළොන්නරු පොලිසිය ප්‍රදේශවාසීන් හා එක්ව අතුරුදන් වූ පුද්ගලයා සොයා තවදුරටත් මෙහෙයුම් සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - මොරවක පොලිස් වසම.

2025.12.01 වන දින උදෑසන කාලයේ මොරවක පොලිස් වසමේ මොරවක නෙළුව ප්‍රධාන මාර්ගයේ කොඩිකාරගොඩ ප්‍රදේශයේදී මොරවක දෙසට ධාවනය වූ පුද්ගලික මගී බස් රථයක පදික කාන්තාවක් ගැටී බරපතල තුවාල ලබා කොස්මිල්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වූ කෝට්ටගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා දෙනියාය රෝහලේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මොරවක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **මාරක රිය අනතුරක් - අළුත්ගම පොලිස් වසම.**

2025.12.01 වන දින රාත්‍රී කාලයේ අළුත්ගම පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ අළුත්ගම වටරවුම ආසන්නයේදී කළුතර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක පදික කාන්තාවක් ගැටී බරපතල තුවාල ලබා සීනිවත්ත රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා නාගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 44 ක් වූ අළුත්ගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර අළුත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**